2013 පෙබරවාරි 13 වැනි දා 'කලම්බු ටෙලිග්‍රාෆ්' වෙබ් අඩවියේ පළවූ
Who Are Full Of "IT"
ලිපියේ සිංහල පරිවර්තනය 'යහපාලනය ලංකා' වෙතින්

# ''ඒකෙන්'' පිරී සිටින්නේ කවුරුන් ද?

එමිල් වැන්ඩර් පූර්ටන්

''ඒක'' ගැන ඇති අළුත්ම උදාහරණය වන්නේ, ආණ්ඩුව හිසේ කෙස් ගානට දේශනා කරන බණ පදයක් නැවතත් අසන්නට ලැබීමයි. එනම්, ''ශ්‍රී ලංකාව ස්වෛරී රාජ්‍යයක් බවත්, එම රාජ්‍ය සීමාව තුළ එහි පාලකයන් කරන කුමක් වුවත්, එම සීමාවෙන් පිටත සිටින කිසිවෙකු ඇඟිලි ගැසිය යුතු දෙයක් නොවන'' බවටත්, අපේ මහාමාන්‍ය පාලකයන් ''අවසාන වශයෙන් තීරණය කරනු ලැබ'' තිබීම යි. මගේ මතකයේ හැටියට, ඇඩොල්ෆ් හිට්ලර්වත් ඒ සා බරපතල අයිතියක් තමන් වෙත පවරා ගත්තේ නැත. ලෝකයේ සමස්ත යුදෙව් ප්‍රජාවම ඉවරයක් කර දැමීමට ඔහු තීරණය කළ අවස්ථාවේ පවා එවැනි අයිතියක් ඔහු ඉල්ලුවේ නැත. එදා ඔහු ඒ සඳහා ඉදිරිපත් කළ න්‍යාය වුණේ, (එය මොන තරම් ව්‍යාජයක් වුවත්), 'වාර්ගික ශෝධනය' නමින් අද හැඳින්වෙන, විශේෂිත ජන කොට්ඨාශයක් ඉවරයක් කර දැමීම හරහා ආරක්ෂා කරගත යුතුව තිබූ, ලොව අන් සියල්ලටම වඩා උසස් යැයි සැළකුණු, ආර්ය වර්ගයක ප්‍රවර්ධනය යි. නූතන ඉතිහාසය තුළ බිහි කරන ලද ඒ රුදුරු රාක්ෂයා පවා, මගේ මතකයේ හැටියට, ප්‍රතිවිපාකවලින් තොර නිදහසක් ස්වකීය ක්‍රියාවන් සඳහා ඉල්ලා සිටියේ නැත. එනම්, ජර්මනිය ඇතුළේ සිදුවන දේවල්, ජර්මනියට මිස වෙන රටකට ප්‍රශ්න කිරීමට අයිතියක් ඇති දේවල් නොවන බවක් කියා සිටියේ නැත.

කෙසේ වෙතත්, අද ''ආසියාවේ මහා වින්නැහිය'' හොබවන අයවළුන් ඉල්ලා සිටින්නේ ඒ සින්නක්කර අයිතිය යි. එය, ''බඩ සුද්ද වෙන විට මියගොස් සිටියේය'' යන අක්=නාමයට සමාන ය. හෙවත්, මේ රටේ වර්තමාන සුචරිතය පිරිහී ඇති තත්ත්වයට සමාන ය.

අපි ප්‍රස්තුතයේ අරටුවට බසිමු. ''ආරක්ෂා කිරීමට ඇති වගකීම'' නැමැති ප්‍රඥප්තියට අදාළ භාවිතය (එනම්, යම් රටක පාලකයෙකු හෝ පාලක පැලැන්තියක් එම රටේ පොදු වැසියන්ගේ හෝ එම පොදු වැසියන්ගෙන් කොටසකගේ ජීවිත විනාශ කරන විට එය නතර කිරීම සඳහා මැදිහත් වීමට වෙනත් ජාතියකට වගකීමක් ඇතැ යි යන ප්‍රතිපත්තිය) එය මොන තරම් දෝෂ සහිත විය හැකි වෙතත්, ලෝකයේ අවසාන යුක්තියක් ආරක්ෂා කරගත හැකි එකම මාර්ගය එයම වන්නේය. ඕනෑම උන්මත්තකයෙකුට රාජ්‍යයේ භෞමික අඛණ්ඩතාව නැමැති පලිහට මුවා වී රටේ පුරවැසියන්ව හිතුමතේට ඝාතනය කිරීමට සහ වචනයෙන් විස්තර කළ නොහැකි කෲරත්වය සහ වධක හිංසනය පුරවැසියා වෙත මුදාහැරීමට සැපයෙන අවසරය සක්‍රීය වශයෙන් අවහිර කළ හැක්කේ එම මාර්ගයෙන්ම පමණි. මීට පෙර ද මා කියා ඇති දෙයක් මම නැවතත් කියමි: අපේ පාලකයන් අද දේශනා කරන මේ බණ හෙවත් චින්තනය (එනම්, අපේ දේවල්වලට ඇඟිලි ගැසීමේ අයිතියක් වෙනත් ජාතීන්ට නැති බව), එදා පැවතියේ නම්, යුද අපරාධ සම්බන්ධයෙන් පැවැත්වුණු නියුරෙම්බර්ග් නඩු විභාග (දෙවැනි ලෝක යුද්ධ කාලය තුළ, යුද්ධයට සම්බන්ධයක් නැති හැට ලක්ෂයක් යුදෙව්වන් ඝාතනය කිරීමේ අපරාධයවලට අදාළ නඩු විභාග) නොපැවැත්වෙනු ඇත. එසේ විණි නම්, එම අපරාධ සියල්ල සිදුවුණේ හිට්ලර්ගේ අධිරාජ්‍යයේ යම් තැනක නිසා, මේ කියන භෞමික අඛණ්ඩතාවයේ මූලධර්මය එම අපරාධකරුවන්ටත් එදා නිදහසට කාරණයක් විය හැකිව තිබුණා නොවේ ද?

එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි ජාත්‍යන්තර ප්‍රජාව, මෙවැනි කාරණා ගැන වටින් ගොඩින් හෝ ප්‍රශ්න කිරීමට පටන්ගත් සැණින් අපේ සිංහල=බෞද්ධ ශිෂ්ටාචාරයේ ස්වයං=ආරක්ෂකයන් කරන්නේ භෞමික අඛණ්ඩතාවයේ සූත්‍රය සජ්ජායනා කිරීමයි. මූලික යුක්ති ධර්මයේ සෑම ප්‍රතිපදාවක්ම ඊට යටත් බව එම සූත්‍රය අනුව ඔවුහු පෙන්වා දෙති. දේශපාලඥයන් සහ මිනීමරු සොරදෙටු මැරයන් (ඒ දෙපිරිස එකිනෙකාගෙන් වෙන්කොට හඳුනා ගැනීම පහසු නැත) පාලනය හොබවන අද දවසේ මේ රටේ දක්නට ලැබෙන නීතියේ වල්වැදීම, අප පත්ව ඇති ආගාධයේ තරම පෙන්වයි. භෞමික අඛණ්ඩතාවය නැමැති ප්‍රබන්ධය අන්න ඒ සඳහා ය. ''ආසියාවේ මහා වින්නැහිය'' මුදුනේ සිටින අපේ පාලකයන්ගේ විරූපය ආවරණය කරගන්නේත්, එය දිගටම පවත්වා ගන්නේත්, මේ කියන ප්‍රබන්ධය තුළ සැඟව ගනිමිනි.

මීට පෙර ද මා කියා ඇති දෙයක් නැවතත් මම කියමි. ''ආරක්ෂා කිරීමට ඇති වගකීම'' නැමැති ප්‍රතිපත්තිය ප්‍රතික්ෂේප කරන මේ නායකයන්ට ඊට විකල්ප වශයෙන් අවශ්‍ය කරන්නේ මෙවැන්නකි: 'භෞමික අඛණ්ඩතාවයේ' හෝ 'ජාතික ස්වෛරීත්වයේ' නාමයෙන් සැපයෙන පරම මුක්තියක්. එනම්, ඕනෑම අපරාධයක් කිරීමෙන් පසු එහි ප්‍රතිවිපාකවලින් නිදහස්ව සිටිය හැකි වාතාවරණයක්. මිනීමරු මැරයන්ගේ අපරාධ විභාග නොකෙරෙන, ඔවුන්ට විරුද්ධව නඩු නැසෙන සහ ඔවුන්ට දඬුවම් නොදෙන පරිසරයක්.

මේ සෝරනාඩු දෙන, ඉවක්බවක් නැති සටන්පාඨ, යුද්ධය අවසානයේ සිට කියා ඇති ගල් පැලෙන බොරු සමග සසඳන්න. එවිට සියල්ල පැහැදිළි වනු ඇත. එනම්, අතාර්කිකත්වය මොන තරම් කර්කශ ද යන්න පැහැදිළි වනු ඇත. මුලින්ම ආණ්ඩුව කීවේ එකම සිවිල් වැසියෙකුවත් ඝාතනය නොවූ බව ය. අපේ රණ විරුවන් යුද්ධයට අවතීරණ වී සිටියේ එක අතකින් ජිනීවා සම්මුතියත් (හෝ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයත්), අනිත් අතින්, සරණාගතයන් සඳහා වන දානමානත් අරගෙන ය. වට කරන ලද යුද භූමියේ සේවය කළ වෛද්‍යවරු යුද්ධයෙන් පසු අත්අඩංගුවට ගනු ලැබ, ප්‍රවෘත්ති සාකච්ඡාවකට යොමු කරවන ලදි. නූතන ගැටුම් ඉතිහාසයේ කිසි දවසක නොවූ විරූ පරිදි, මේ වෛද්‍යවරු, ගොඩබිමින් මුහුදෙන් සහ ගුවනින් කරන ලද ප්‍රහාරයන් පිළිබඳ තමන් විසින්ම කලින් එවන ලද වාර්තා, සිවිල් ජීවිතවලට සිදුවූ හානි පිළිබඳව සහ අසාධ්‍ය තුවාලකරුවන්ගේ ජීවිත බේරා ගැනීම සඳහා හදිසි ආධාර ඉල්ලා එවන ලද වාර්තා සියල්ල මේ ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී ඉල්ලා අස්කර ගත්හ. මේ නිදර්ශනයෙන් පෙන්නුම් කෙරුණු ඒ ප්‍රතිපත්ති රහිත සංග්‍රාම සෙනෙවිරත් වුණේ, ''හිංසාවක් නොකරනු'' යන වෘත්තීය දිව්රුමක (හිපොක්‍රටිස්) ප්‍රථම ශික්ෂා පදයෙන් බැඳී සිටි කෙනෙකි.

සිවිල් ජීවිත විනාශ වීමේ සාක්ෂි වැඩි වන්නට වූ විට තනුව වෙනස් වන්නට පටන් ගත්තේය. බිංදුව සම්භාහනය කොට, 'කොටි සාමාජිකයන් සිවිල් වැසියන් වශයෙන් වෙස් මාරුකරගෙන සිටින්නට ඇතැ යි සිතීම නිසා ඇතැම් අයවළුන් ඝාතනය වන්නට ඇතැ'' යි මුලදී ප්‍රකාශ කොට, අනතුරුව ''යුද්ධයේ අතුරු ආපදාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් සිවිල් වැසියන් ද ඝාතනය වන්නට ඇති බව'' අකමැත්තෙන් වුවත් පිළිගන්නට සිදුවිය. ''ඒකෙන්'' මොන තරම් බරට පිරී සිටියේ ද යත්, එක සිවිල් ජීවිතයක්වත් ඝාතනය නොකිරීමේ සිට නන්දිකාදල් කලපුවේ දී ඝාතනය වූ සියල්ලන් කොටින් නොවිය හැකි බව දක්වා අකමැත්තෙන් වුවත් පසුබැසීම ලෙහෙසි පහසු නොවේ. කළ වරදකින් පළායාම සඳහා ගොතන කතාන්තරවලින් බුද්ධිමත්ව ගැලවීම ඉතා අසීරු යි. එවැනි කතා තුළ උද්ධච්ච භාවය පෝෂණය කෙරේ. ගින්නට තෙල් වැටේදෝ යන බියෙන්, ඊළඟට සැබෑව එකහෙලා ප්‍රතික්ෂේප කෙරේ.

වසර කිහිපයකට පෙර, පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල අපේ සාක්කුවේ යැයි කියැවුණි. මතක ද? එහෙත් කල් තියා කවුරුත් දන සිටි පරිදි, එය ගෝල්ඩ් කෝස්ට් විසින් ඉතා පහසුවෙන්ම දිනාගත් බව මතක ද?

ඊටත් ටික කලකට කලින්, ''ඊළඟ අවුරුද්දේ ඉඳං අපේ කාර්වලට ගහන්නේ ශ්‍රී ලංකාවේ පෙට්‍රල්'' යැයි කියැවුණි. මතක ද? එහෙත්, ඉච්ඡාකාරයන්ගේ කයිවාරුවලට සරිලන්නට මන්නාරම් බොක්කෙන් තෙල් ඉනුවේ නැත.

මේ සියල්ල මොන තරම් හාස්‍යාකාර සේ පෙනුණත්, මෙය සිනහවට කාරණයක් නොවන බව මතක තියාගන්නඃ මන්ද යත්, මිනිස් ඝාතනය සහ විනාශය, අපරාධකාරයා මන්ද බුද්ධික විරිත්තිල්ලක් මුවගට නගාගෙන කළත්, එය මනුෂ්‍ය ඝාතනයක් සහ විනාශයක්ම වන බැවිනි. කවුරුන් විසින් සිදුකළත්, අවසාන ගමනාන්තය වන්නේ මරණය යි. මේ සියල්ලෙන් පෙන්නුම් කරන්නේ, ඔවුන් ''ඒකෙන්'' මොන තරම් පිරී සිටියත්, සමාජයේ ශිෂ්ඨ සම්පන්න පැවැත්මට ඔවුන්ගෙන් සිදුවිය හැකි හානිය මොන විදිහකින්වත් අඩු නොවන බව යි.